# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 41 දරන

# මහා භාරකාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ඔක්තෝබර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 20 යි.    තැපැල් ගාස්තුව : ශත 50 යි

1983 අංක 41 දරන මහා භාරකාර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස් 17 වන දින]

එල්. ඩී.—ඕ. 21/83

**මහා භාරකාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1983 අංක 41 දරන මහා භාරකාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහා භාරකාර ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙසින් සංශෝධනය කරනු ලැබේ :— — 88 වන අධිකාරයේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඉඉ) අන්‍යෝන්‍ය වශයෙන් එකඟත්වයට එළඹිය හැකි ගාස්තු ද ඇතුළත් නියම හා කොන්දේසි මත වූ ගිවිසුමක් පිට නිශ්චල දේපළක කළමනාකරු ලෙස ;".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙසින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(6) 5 වන වගන්තියේ (ඉඉ) ඡේදය යටතේ, නිශ්චල දේපළක කළමනාකරු ලෙස මහා භාරකාරවරයා පත් කරනු ලැබ ඇති අවස්ථාවක, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතුය.".

ඒ 72052—9,575 (83/09)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.